ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා/ස්වභාවික විද්‍යා ගෞරව
උපාධි වැඩසටහන - 2023/2024
හයවන මට්ටම
අවසාන පරීක්ෂණය 2024
**STU6314 - ප්‍රාථමික අධ්‍යාපනය**
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2024.12.19 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## <u>01 වන කොටස</u>

01. ප්‍රාථමික පාසල් ගුරුවරුන්ට අධ්‍යාපන දර්ශනය පිළිබඳ දැනුම වැදගත් බව පෙන්වීමට හේතු පහක් **(05)** සඳහන් කරන්න.

02. "ශිෂ්‍ය කේන්ද්‍රීය" අධ්‍යාපනයේ ප්‍රබලතා තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න.

03. "අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා" සහ "අභිමත ඉගෙනුම් නිපුණතා" අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

04. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන විෂය මාලාව ප්‍රධාන අවධි තුනක් (03) සහ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම තුනකින් (03) සමන්විත වේ. එම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම තුන **(03)** නම්කර එම ක්‍රම පළමුවන ප්‍රධාන අවධියේ සිට තුන්වන (03) වන ප්‍රධාන අවධිය දක්වා ක්‍රියාත්මක වන ආකාරය රූපසටහනක් මගින් පැහැදිලි කරන්න.

05. ප්‍රාථමික අධ්‍යාපනයේ "සමෝධානිත ප්‍රවේශය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ප්‍රාථමික පාසල් ගුරුවරයා විෂයමාලා කළමනාකරුවෙකු ලෙස ඔහුගේ/ ඇයගේ භූමිකාව කෙටියෙන් සාකච්ඡා කරන්න.

07. ප්‍රාථමික පාසල් විදුහල්පතිවරයෙකුගේ භූමිකා පහක් **(05)** නම් කර ඉන් එක් භූමිකාවක් කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශකරයෙකුගේ කාර්යයන් තුනක් **(03)** ලියන්න. ඉන් එක් කාර්යයක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 5x8=40)

## 02 වන කොටස

09. (i.) 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලින් ප්‍රාථමික අධ්‍යාපනයේ සිදුවූ වෙනස්කම් පහක් **(05)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii.) "ප්‍රාථමික පන්තිවල සිසුන් නිපුණතා වල ප්‍රවීණත්වය සහතික කිරීම ඒ ඒ අවධිවල සිදුවිය යුත්තකි."
ඔබ මෙම ප්‍රකාශයට එකඟවන්නේ ද?
ඔබගේ පිළිතුර සාධාරණීයකරණය කරන්න. (ලකුණු 10)

10. (i.) අධ්‍යාපනික දාර්ශනිකයන් අතරින් එක් පුද්ගලයෙක් තෝරාගෙන අධ්‍යාපන පද්ධතිය පිළිබඳ ඔහු/ඇය ඉදිරිපත් කළ අදහස් මොනවාදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 10)

(ii.) "සැමට අධ්‍යාපනය" විශ්ව ප්‍රකාශනයේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

11. (i.) "ළමා හිතකාමී" ඉගෙනුම් පරිසරයක ලක්ෂණ විශ්ලේෂණය කරන්න.
(ලකුණු 10)

(ii.) ඔබ, භෞතික හා මනෝවිද්‍යාත්මක ඉගෙනුම් පරිසරය ඵලදායි ආකාරයෙන් සැලසුම් කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i.) "තක්සේරු කිරීම" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 05)

(ii.) ප්‍රාථමික ශ්‍රේණිවල තක්සේරු කිරීමේ ක්‍රම මොනවාද? (ලකුණු 07)

(iii.) ප්‍රාථමික ශ්‍රේණිවල ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා තක්සේරුකරණය වැදගත්වන ආකාරය සාකච්ඡා කරන්න.
(ලකුණු 08)

13. (i.) "ප්‍රාථමික ශ්‍රේණිවල ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථකත්වය සඳහා දෙමව්පියන්ගේ සහ ප්‍රජා සහාය අත්‍යවශ්‍ය වේ." මෙම කියමන සමඟ ඔබ එකඟද? උදාහරණ තුනක් **(03)** ඉදිරිපත් කරමින් ඔබගේ පිළිතුර සාධාරණීයකරණය කරන්න.
(ලකුණු 10)

(ii.) "ළමයින්ගේ පූර්ණ සංවර්ධනයට උදව් කිරීම අධ්‍යාපනයේ ප්‍රධාන කාර්ය විය යුතුය." ඉහත සඳහන් කාර්ය ප්‍රාථමික අධ්‍යාපන ක්‍රියාවලිය තුළදී කෙතරම් දුරට ඉටුවන්නේ දැයි විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

\- හිමිකම් ඇවිරිණි. -